**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**----------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත විස්තර දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුව තිබුණු රු. 5,350,189 ක් වූ දායක මුදල මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) දෙමටඅත්ත වැව පාර, වම්පස පළමු වන හරස් පාර ජල නල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලැබුණු හා ගෙවා තිබූ රු. 577,116 ක මුදල විවිධ තැන්පත් ගිණුමට හර හා බැර කිරීම නිසා එම වටිනාකම් වර්ෂයේ ආදායමින් හා වියදමින් අත්හැරී තිබුණි.

(ඇ) 2016 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වලින් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සභා අරමුදල් යොදවා නිම කර තිබූ රු. 572,974 ක් වූ කර්මාන්ත 3 ට අදාළව ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) මයුරපුර සතිපොළෙහි වෙළඳකුටි ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු. 542,246 ක් අඩුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.

(ඉ) රු. 92,346 ක් වූ විගණන ගාස්තු ගෙවා තිබුණු නමුත්, ණයහිමි ලේඛනය යාවත්කාලීන නොකිරීම නිසා රු. 90,746 ක ශේෂයක් ණයහිමි ලේඛනයේ ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තුව රු. 26,050 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(උ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ නව සභා ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු ඒකක 202 කින් යුතු කාර්යාල උපකරණ තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 09 ක ශේෂයන් සහ ඊට අදාළ පොත් පත් හා උප ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 15,685,859 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

2003 වර්ෂයේදී ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 27,650 ක ආපදා ණය ශේෂය සහ 2011 වර්ෂයටත් පෙර සිට අය විය යුතු රු. 736,929 ක් වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල මුළු එකතුව රු. 5,109,491 ක් වූ අතර, එයින් රු. 1,182,923 ක් වූ බදු වර්ග තුනක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-----------------------------------

එකතුව රු. 20,835,941 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වලට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා හා උප ලේඛනය, රු. 7,877,272 ක් වූ හිඟ කර්මාන්ත ණයගැති ශේෂ වලට අදාළ යාවත්කාලීන කරන ලද කර්මාන්ත ලේඛනය සහ කාල විශ්ලේෂණ සහ රු. 383,673 ක් වූ විවිධ ණයහිමි ශේෂයට අදාළ කාල විශ්ලේෂණද, ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති 218 | සභාවට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණය කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 103, 104,105 හා 110 | සභාවට අයත් ට්‍රැක්ටර් රථයක් අනතුරට භාජනය වීමෙන් සිදුවී තිබුණු රු. 133,275 ක අලාභය මූලික විමර්ෂණයක් සිදුකර වගකිව යුතු අයවලුන් හඳුනාගෙන ඔවුන්ගෙන් අදාළ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 210 (1) | 2016 වර්ෂය සඳහා රු. 160,345 ක ජල ගාස්තු ගෙවීමේදී වට්ටම් වාසි ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කර නොතිබුණි. |
| iii. මුදල් රෙගුලාසි 156(1) හා 210 (2) | ගෙවීම් ප්‍රමාද කිරීම හේතු කොට ගෙන කිසියම් ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදු වුවහොත් එම මුදල් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණු රු. 7,546 ක ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| iv. මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවා තිබුණු එකතුව රු. 88,515 ක් වූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| v. මුදල් රෙගුලාසි 571(3) | 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අයත් එකතුව රු. 2,285,498 ක් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 1.3.6 අධිකාරි බලය නොලත් ගනුදෙනු

----------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා වූ සමස්ථ ප්‍රතිපාදනය රු. 4,215,000 ක් වුවද, ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ රු. 4,799,082 ක් සහ පුනරාවර්තන වැය විෂයයන්ට හර කරමින් රු. 1,067,885 ක් ගෙවීම් කර තිබුණි. ප්‍රතිපාදන සීමාව ඉක්මවා දරන ලද රු. 1,646,467 ක වියදම් පියවා ගැනීමට 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14 (1) සහ 14 (2) විධිවිධාන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 3,821,455 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 6,205,098 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,026,553 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 90 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණ විය.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, සමාලෝචිත වර්ෂයේදී එම අගය ස්වයං උත්පාදන ආදායම මෙන් දෙගුණයක් ඉක්මවා ඇති බවත් ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොමැති බවත් පෙන්නුම් කෙරුණි.

## 2.3 ආදායම් පරිපාලනය

-------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ රු. මිලියන 17.01 ක් වූ මුළු පුනරාවර්තන ආදායම් වලින් රු. මිලියන 11.34 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 67 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු. මිලියන 18.2 ක් වූ ලැබිය යුතු ආදායම් වලින් රු. මිලියන 4.62 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයවීමේ ප්‍රගතිය සියයට 25 ක අගයක් ගෙන තිබුණි.

### 2.3.2 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 820,493 ක් වූ අතර, රු. 2,500 කට වැඩි හිඟ ශේෂ සහිත බදු ඒකක 65 කින් අයවිය යුතු එකතුව රු. 445,542 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.3 බදු කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2009 ජූලි මස බදු දී තිබුණු සූරියවැව අඩි 100 පාරේ තිස්සපුර කඩ කාමර 12 ක් සඳහා තක්සේරු වාර්තා ලබා නොගෙන සභා තීරණයක් මත කඩ කාමර 6 කින් මසකට රු.250 බැගින් හා ඉතිරි 6 න් රු.300 බැගින් අයකරමින් පැවතුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 ඡේදය අනුව වසර 05 කට වරක් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළ යුතුව ඇතත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය අනුව විවිධ වෘත්තීන් සම්බන්ධයෙන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, නීතිඥ, වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ටාර් වැනි වෘත්තීන් වලින් බලපත්‍ර ගාස්තු අයකිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයට පෙර සිට හිඟව පවතින රු. 736,930 ක් වූ බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

### 2.3.5 විනෝද බදු

-------------

හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2013 වර්ෂයේ ආරම්භ කර ඇති කුරුළු උයන සහ වියළි කලාපීය උද්භිද උද්‍යානය නැරඹීම සඳහා අලෙවි කරන ටිකට්පත් වලින් විනෝද බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 4,456,802 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 12,986,375 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්ය සාධනය**

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි ප්‍රාදේශීය සභාවේ කාර්යභාර්ය පදනම් කරගෙන බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ කාර්යය හා කර්තව්‍යය ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) අයවැය ලේඛනය මගින් භෞතික සැලසුම්, මංමාවත් , ඉඩම් හා ගොඩනැගිලි යන වැඩසටහන් යටතේ රු. 2,000,000 ක ප්‍රාග්ධන ආදායම් හා රු. 3,965,000 ක ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කර තිබුණි. එම ප්‍රාග්ධන ආදායම් ලැබෙන ආකාරය හා රු. 1,965,000 ක ප්‍රාග්ධන වියදම් කුමන කාර්යයන් සඳහා උපයෝජනය කරන්නේද යන්න දක්වා නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2016 යටතේ සභා බල ප්‍රදේශයට පිවිසෙන මාර්ග හඳුනා ගැනීම සඳහා නාම පුවරු 05 ක් සැකසීමට දෙසැම්බර් මස රු. 187,500 ක් ගෙවා තිබූ නමුත්, 2017 අප්‍රේල් 28 දින වන විටත් එම පුවරු සවිකර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් ට්‍රැක්ටර් රථ දෙකක් සමාලෝචිත වර්ෂයේදී ධාවන කටයුතු සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ආ) පිරිවැය රු. 500,000 ක් වූ 12.5 KV ඩීසල් ජෙනරේටරය වසර 07 ක කාලයක සිටද, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2015 නොවැම්බර් සිටද නිෂ්ක්‍රීයව පවතින නමුත්, ඒවා අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

වසර 30 ක සිට සභා කාර්යාලය පවත්වාගෙන යන ඉඩමේ සහ අනෙකුත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

### 3.4 වාහන පාලනය

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ප්‍රවාහන ඇණියට වාහන 30 කට අධික ප්‍රමාණයක් ඇතුළත්ව තිබුණු නමුත්, ඒවායේ තොරතුරු ඇතුළත්කර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ආ) සභාවට ලැබී දීර්ඝ කාලයක් ගත වී තිබුණු වාහන 14 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සෑම මාස 06 කට වරක්ම වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, 2016 වර්ෂයේදී සභාවට අයත් කිසිදු වාහනයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබා නොගෙන වාහන 16 ක් ධාවනයට යොදවා තිබුණි.

### 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

රාජ්‍ය නොවන සංවිධානයක් විසින් 2007 වසරේදී සභාවට පරිත්‍යාග කර තිබූ ජංගම පුස්තකාල බස් රථය 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. 2013 ඔක්තෝබර් 28 දින ලැබුණු සභා අනුමැතිය මත බස් රථය කුලී පදනම මත ලබා දීමට සුදුසු පරිදි ආසන සවිකර නවීකරණය කිරීම සහ වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා රු. 555,250 ක් 2015 අප්‍රේල් 01 දින ගෙවා තිබුණි. එහෙත් එදින සිට 2017 මාර්තු 31 දින දක්වාම ධාවනයට යොදවා ගත නොහැකිවී තිබුණි.

### 3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන කසල ප්‍රමාණය පිළිබඳව ගණනය කර නොතිබුණු අතර, සභාව විසින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාමසේවා වසම් 23 කින් වසම් 03 ක් ආවරණය කරමින් කසල ටොන් 01 ක් පමණ දෛනිකව එකතු කරනු ලබයි. දෛනිකව රැස් කරන කසල වලින් කොම්පොස්ට් නිෂ්පාදනය කරනු ලබන අතර, ඉතිරි වන ඝණ අපද්‍රව්‍ය බුරුතැන්කන්ද බොල්හිද ප්‍රදේශයේ අක්කර 05 ක පමණ සභාව සතු භූමි ප්‍රදේශයට මුදා හැරීම සිදු කර තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියක් පවත්වා ගෙන ගියද, පරිසර බලපත්‍රය හෝ පාරිසරික නිර්දේශ ලබා ගෙන නොතිබුණු අතර, දැරීමට සිදුවන වියදම් ආවරණය කර ගැනීමට කසල බදු පනවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 කාර්ය මණ්ඩල කළමනාකරණය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක පස් දෙනෙකුගේ අතිරික්තයක් සහ තවත් තනතුරු 05 ක හය දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත්කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂයේදී වියදම් විෂයයන් 06 ක් සඳහා අයවැය ලේඛනය මගින් සලසා තිබුණු එකතුව රු. 85,000 ක මුළු ප්‍රතිපාදන ඉතිරිවීම්ද, වියදම් විෂයයන් 05 ක එකතුව රු. 7,238,259 ක ඉතිරිකිරීම්ද, ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් එකතුව රු. 10,642,201 ක ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

------------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම**

-------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ස්ථාවරවත්කම් පාලනය
(ඈ) අයවැය පාලනය